# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009**

**(2010 මැයි / ජූනි)**

**මානවශාස්ත්‍ර පීඨය**

**බෞද්ධ දර්ශනය -BUPH- E2015**

**බෞද්ධ මනෝ විග්‍රහය හා ආචාර ධර්ම**

**එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන <u>ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න</u>**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි    කාලය : පැය 03 යි

---

### <u>i කොටස - බෞද්ධ මනෝ විග්‍රහය</u>

1. "මනෝවිද්‍යාව යනු චර්යාව හා අනුභූතිය පිළිබඳ අධ්‍යයනයකි." මෙම අදහස බෞද්ධ මනෝ විග්‍රහය සම්බන්ධයෙන් කොතෙක් දුරට අදාළ කර ගත හැකිදැයි පෙන්වා දෙන්න.

2. බාහිර ලෝකය ඉන්ද්‍රිය ගෝචර වීම හේතු කොට ගෙන මිනිසා නිරන්තර චින්තන ක්‍රියාවලියක නිමග්න වන ආකාරය මධුපිණ්ඩික සූත්‍රයට මුල් තැන් දෙමින් පැහැදිලි කරන්න.

3. "බෞද්ධ ඉගැන්වීම්වලට අනුව මානසික ගති ලක්ෂණ පෞරුෂ වර්ගීකරණයේ ප්‍රධාන සාධකය ලෙස සැලකේ." සාකච්ඡා කරන්න.

4. "මිනිස් සන්තානය දුකින් පිරී ඇත යන ස්ථාවරයෙහි පිහිටා සිටින බෞද්ධ ඉගැන්වීම් ඊට හේතු මෙන්ම විසඳුම් ද ඉදිරිපත් කරයි" අදාළ සූත්‍ර දේශනා ඇසුරින් පැහැදිලි කරන්න.

5. චිත්ත සමාධිය වර්ධනය කරගැනීමෙහි ලා ශීලයෙහි වැදගත්කම පෙන්වා දෙන්න.

### <u>ii කොටස - ආචාර ධර්ම</u>

6. සදාචාර ධර්ම පද්ධතියක මූලික ලක්ෂණ බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් පැහැදිලි කරන්න.

7. බෞද්ධ සදාචාර ධර්මයන්හි අන්තර්ගත ප්‍රමාණීකෘත (normative) හා විස්තරාත්මක (descriptive) ලක්ෂණ නිදසුන් සහිතව ඉදිරිපත් කරන්න.

8. සදාචාර හේතුකරණයෙහි ලා බෞද්ධ ඉගැන්වීම් පාදක කොට ගෙන ඇති මූලධර්ම කවරේදැයි පෙන්වා දෙන්න.

9. පින හා කුසලය බෞද්ධ සදාචාර ධර්ම පද්ධතියෙහි අර්ථවත් කොට දක්වා ඇති ආකාරය අදාළ සූත්‍ර දේශනා ඇසුරෙන් සාකච්ඡා කරන්න.

10. බෞද්ධ ඉගැන්වීම්වලට අනුව ස්වාර්ථ සිද්ධිය පදනම් කොට ගනිමින් පරාර්ථ සිද්ධිය ඇතිවන ආකාරය පැහැදිලි කරන්න.